**<u>ව්‍යාපෘති යෝජනාව</u>**

**<u>බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</u>**

**01.ව්‍යාපෘති නාමය-බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවා සැපයීම වඩා විධිමත් කිරීම සඳහා කෙටි පණිවිඩ ජාලයක් ස්ථාපනය කිරීම**

02. විධායක සාරාංශය

ප්‍රාදේශීය ලේකම් කාර්යාල යනු රජය විසින් ජනතාවට අවශ්‍ය සේවාවන් සැපයීම සඳහා ප්‍රාදේශීයව පිහිටුවා ඇති ප්‍රමුඛතම සේවා සපයන ආයතනය හා ජනතාවට වඩා සමීපතම රාජ්‍ය ආයතනය වේ.නූතන තාක්ෂණ ලෝකයේ පෞද්ගලික ආයතන තාක්ෂණික භාවිතයත් සමඟ වඩා පහසුවෙන් හා විවිධ අගයන් එකතු කරමින් සේවා සපයන පසුබිමක් තුළ රාජ්‍ය ආයතන තුලින්ද පොදු මහජනයා මෙන්ම අභ්‍යන්තර කාර්ය මණ්ඩලයද එකී ත්ත්වයත් බලාපොරොත්තු වේ.එමෙන්ම ආපදා අවදානම අධික කොට්ඨාසයක් ලෙස බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහජනයා එහි අවදානම් තත්ත්ව පිළිබඳ ක්ෂණිකව දැනුවත් කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත.ඉහත තත්වයන් සැළකිල්ලට ගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් සංවිධානය කරනු ලබන ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටුව,කොට්ඨාස රැස්වීම,කෘෂිකර්ම කමිටුව,ආදී කමිටු හා රැස්වීම් පිළිබඳ බාහිර රාජ්‍ය ආයතන ප්‍රධානීන් හා අභ්‍යන්තර කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් සපයනු ලබන සේවාවන් එහි කටයුතු අවසන් වූ විගස සේවාලාභීන් දැනුවත් කිරීම ,ආපදා අවස්ථාවලදී ගංවතුර තත්ත්ව ඉහල යන්නේ නම් අවදානම් ප්‍රදේශවල ජීවත්වන ජනයා දැනුවත් කිරීම,නාය අවදානම් සහිත ඉවත්කළ යුතු පවුල් දැනුවත් කිරීම,අපදා කළමණාකරණ කමිටු සාමාජිකයින් සක්‍රිය කිරීම ආදී වූ කටයුතු පිළිබඳ දැනුවත් කිරීම සඳහා කෙටි පණිවිඩ සේවාවක් පවත්වා ගැනීම අපේක්ෂාව වේ.එමඟින් වඩා පහසුවෙන් තොරතුරු සන්නිවේදනය කළ හැකි වීම හා තොරතුරු නිසි පරිදි සන්නිවේදනය නොවීම නිසා ඇතිවන ගැටළු හා අවදානම අවම කර ගත හැකි වනු ඇති අතර පෞද්ගලික අංශය මඟින් එදිනෙදා කටයුතු සඳහා කෙටි පණිවිඩ සේවාවන් සැපයීමෙන් සේවාලාභීන් ඒ කෙරෙහි නැඹුරුවක් හා අවධානයෙන් හා අපේක්ෂාවෙන් සිටින්නා සේ රාජ්‍ය අංශය තුළින්ද එම පහසුව මහජනයා වෙත ලැබෙනු ඇත.

03 අරමුණු හා ප්‍රතිලාභ -

- රැස්වීම් දින හා වේලාවන් පහසුවෙන් දැනුම් දිය හැකි බැවින් අනවශ්‍ය දුරකථන ඇමතුම්,ලිපි යොමු කිරීම් ආදිය සඳහා යන වැය බර අඩු වීම,පණිවිඩ නිසිලෙස අදාලම පුද්ගලයා වෙත නොලැබීයාම ආදී ගැටළු අවම වීම
- සේවා ලාභීන් හට තම සේවා අවසන් බව කඩිනමින් සන්නිවේදනය කිරීම මඟින් අනවශ්‍ය පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පැමිණීම අවශ්‍ය නොවීම,එමඟින් මහජනයාගේ හා අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ කාලය ඉතිරි වීම, අල්ලස් හෝ දූෂණය සඳහා ඉඩකඩ මඟහැරී යාම.
- ආපදා අවස්ථාවලදී ජල මට්ටම ඉහළ යන අවස්ථාවලදී ,වර්ෂාපතනය ඉහළ යන විට,කුකුළේගඟ ජල විදුලි බලාගාරයේ වාන් දොරටු විවෘත කරනු ලබන අවස්ථාවලදී ආපදා අවදානම අධික කලාපවල සිටින නිලධාරීන් ,ආපදා කමිටු නියෝජිතයින් ,මහජනයා එම අවදානම පිළිබඳ දැනුවත් කිරීම තුළින් ජීවිත හා දේපළ හානි අවම කර ගැනීම
- නාය අවදානම ඉහල යනු ලබන අවස්ථාවලදී (NBRO තීරණය කරනු ලබන විට)අවදානම් පවුල් හා නිලධාරීන් දැනුවත් කිරීම තුළින් ඇතිවිය හැකි අවදානම පිළිබඳ පෙර සූදානම ඉහල නැංවීම හා අවදානම ට පෙර එකී පවුල්වලට එම ස්ථානවලින් ඉවත් වීමට දැනුවත් කිරීම තුළින් ජීවිත අවදානම වලක්වා ගැනීම
- මහජනයා අතර තෘප්තිකර බවක් හා අභ්‍යන්තර සේවකයන් අතර අභිමානයක් වර්ධනය වීම

04.හඳුනාගත් කෙටි පණිවිඩ ජාලය ක්‍රියාත්මක කළ හැකි සේවා සහ අවස්ථා

| අනු අංක | කාරණය | යොමු කළ යුතු පණිවිඩ සංඛ්‍යාව (මාසිකව දළ වශයෙන් ) |
|---|---|---|
| 01 | මාසිකව පවත්වනු ලබන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව ,කොට්ඨාස රැස්වීම් ,කෘෂිකර්ම කමිටුව පිළිබඳ බාහිර අභ්‍යන්තර නිලධාරීන් දැනුවත් කිරීම් සඳහා | 800 |
| 02 | වෙනත් හදිසියේ කැඳවීමට සිදුවන කමිටු හා රැස්වීම් පිළිබඳ දැනුවත් කිරීම | 250 |
| 03 | ආපදා අවස්ථාවලදී නිලධාරීන් දැනුවත් කිරීම හා පෙර සූදානම ඇති කිරීම | 250(අවස්ථාවක් උද්ගත වු විට) |
| 04 | ආපදා අවස්ථාවලදී ගංවතුර මට්ටම ඉහළ යන විට/වාන් දොරටු විවෘත කරන විට ආපදා කමිටු හා මහජනයා දැනුවත් කිරීමට | 300 |
| 05 | නාය අවදානම ඉහල යන විට අධික වර්ෂාකාලයේදී ඉවත් කළ යුතු බවට NBRO නිර්දේශ ලබා දී ඇති පවුල් සෘජුවම දැනුවත් කිරීම | 250 |
| 06 | නාය අවදානම ඉහල යන විට ඉවත්වන ලෙස දැනුවත් කර එහෙත් යම් හේතු මත එම ස්ථානවලම රැදී සිටින පවුල් සෘජුවම දැනුවත් කිරීමට | 150 |
| 07 | කඩිනමින් ලබා දිය යුතු වාර්තා /ප්‍රගතිය පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීම හා සිහිකැඳවීමට | 200 |
| 08 | සේවාලාභීන් විසින් සේවා අපේක්ෂාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී ඇති ඉල්ලීම් /අයදුම්පත්‍ර පිළිබඳ ඉල්ලීම් ඉටුවී ඇත් බව ,අයදුම්පතු අනුමත වී ඇති බව සේවාලාභියාට සෘජුව සන්නිවේදනය කිරීමට (අදාල සේවා පිළිබඳ විස්තර අමුණා ඇත ) | 2000 |
| | **එකතුව** | **4200** |

05.කෙටි පණිවිඩ සේවාව ලබා ගැනීම සඳහා වැය ඇස්තමේන්තුව

ඉහත අවශ්‍යතාවයන් පිළිබඳ මෙම සේවාවන් සපයනු ලබන දුරකථන සන්නිවේදන ආයතන වෙතින් විමසීම් කිරීමේදී පහත පරිදි ඒ සඳහා මාසිකව ගෙවීම් කළ යුතුබව හඳුනාගන්නා ලදී. (බදු රහිතව)

| අනු අංක | ආයතනය | මාසික අය කිරීම | සේවා ලාභී කෙටි පණිවිඩ /වෙනත් පහසු කම්(නොමිලයේ) | වැඩිවන කෙටි පණිවිඩ 01 ක් සඳහා අය කිරීම | මූලික ගෙවීම |
|---|---|---|---|---|---|
| 01 | Dialog ආයතනය | 2500 | 5000 (any net work)නොමිලයේ | Dialog 0.50<br>Other 0.80 | - |
| 02 | Mobitel ආයතනය | 5900 | M2M 3000<br>M2O 3500 | mobitel 0.80<br>Other 1.00 | 30,000.00 |
| 03 | Etiselat ආයතනය | 5000 | 5000 (any net work) | Any 1.50 | - |

06.අපේක්ෂිත ප්‍රථිපල

| අනු අංක | කාරණය | යොමු කළ යුතු පණිවිඩ සංඛ්‍යාව (මාසිකව දළ වශයෙන් ) | අපේක්ෂිත ප්‍රතිඵල |
|---|---|---|---|
| 01 | මාසිකව පවත්වනු ලබන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව ,කොට්ඨාස රැස්වීම් ,කෘෂිකර්ම කමිටුව පිළිබඳ බාහිර අභ්‍යන්තර නිලධාරීන් දැනුවත් කිරීම් සඳහා | 800 | කාලය ඉතිරිවීම,ලිපිද්‍රව්‍ය වියදම අඩු වීම,ප්‍රමාද වීම් අවම වීම නිසා නිසි වේලාවටම රැස්වීම් ආරම්භ කිරීමට හැකි වීම හා නොපැමිණීම් ඇතිවන ගැටළු අවම වීම |
| 02 | වෙනත් හදිසියේ කැඳවීමට සිදුවන කමිටු හා රැස්වීම් පිළිබඳ දැනුවත් කිරීම | 250 | හදිසි අවස්ථාවකදී නිලධාරීන් ක්ෂණිකව කැඳවා ගැනීමට හැකි වීම,හදිසිතීරණ ගත යුතු හා සේවා සැපයිය යුතු අවස්ථාවකදී එම කටයුතු විධිමත් වීම හා කාර්යක්ෂම වීම |
| 03 | ආපදා අවස්ථාවලදී නිලධාරීන් දැනුවත් කිරීම හා පෙර සුදානම ඇති කිරීම | 250(අවස්ථාවක් උද්ගත වූ විට) | |
| 04 | ආපදා අවස්ථාවලදී ගංවතුර මට්ටම ඉහළ යන විට/වාන් දොරටු විවෘත කරන විට ආපදා කමිටු හා මහජනයා දැනුවත් කිරීමට | 300 | |
| 05 | නාය අවදානම ඉහල යන විට අධික වර්ෂාකාලයේදී ඉවත් කළ යුතු බවට NBRO නිර්දේශ ලබා දී ඇති පවුල් සෘජුවම දැනුවත් කිරීම | 250 | හදිසි ආපදාවකදී ඇතිවිය හැකි ජීවිත හා දේපළ හානි අවම කර ගැනීමට හැකි වීම |
| 06 | නාය අවදානම ඉහල යන විට ඉවත්වන ලෙස දැනුවත් කර එහෙත් යම් හේතු මත එම ස්ථානවලම රැඳී සිටින පවුල් සෘජුවම දැනුවත් කිරීමට | 150 | |
| 07 | කඩිනමින් ලබා දිය යුතු වාර්තා /ප්‍රගතිය පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීම හා සිහිකැඳවීමට | 200 | හදිසි වාර්තා කලට වේලාවට යැවීමට හැකි වීම |
| 08 | සේවාලාභීන් විසින් සේවා අපේක්ෂාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී ඇති ඉල්ලීම් /අයදුම්පත්‍ර පිළිබඳ ඉල්ලීම් ඉටුවී ඇති බව ,අයදුම්පත්‍ර අනුමත වී ඇති බව සේවාලාභියාට සෘජුව සන්නිවේදනය කිරීමට (අදාල සේවා පිළිබඳ විස්තර අමුණා ඇත ) | 2000 (පමණ) | මහජනතාවගේ කාලය, ශ්‍රමය හා මුදල් ඉතිරි වීම,කාර්යාල පරිශ්‍රය තුළ මහජන තදබදය අවම වීම,සේවා සැපයීම කාර්යක්ෂම වීම හා විශ්වාසදායී වීම |

ඇමුණුම අංක 01

| අනු අංක | මහජනයාට කෙටි පණිවිඩ මඟින් දැනුම් දිය හැකි ඉටුවී ඇති /අනුමත වී ඇති සේවාව | මාසික දළ කෙටි පණිවිඩ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | පවුල් පසුබිම් වාර්තාවනිර්දේශ කර ඇති බව ,පැමිණ රැගෙන යන ලෙස දැනුම් දීම | 30 |
| 02 | වැඩිහිටි හැඳුනුම්පත් සකස් කර ඇති බව දැනුම් දීම සඳහා | 20 |
| 03 | ස්වයංරැකියා ආධාර අනුමත වී ඇති බව දැනුම් දීම සඳහා | 05 |
| 04 | රෝද පුටු, කිහිලි කරු,අත්වාරු උපකරණ ලැබී ඇති බව දැනුම් දීම | 05 |
| 05 | ස්වේච්ඡා සමිති ලියාපදිංචි කර සහතිකය ලබා ගත හැකි බව දැනුම් දීම | 05 |
| 06 | සෘජු ආධාර/සමාජ සේවා ආධාර වල චෙක්පත් ලබා ගත හැකි බව දැනුම් දීම | 10 |
| 07 | රු.3000.00 විශේෂ අවශ්‍යතා දීමනාව ලබා ගත හැකි බව දැනුම් දීම | 100 |
| 08 | මාසික වැඩිහිටි දීමනාව සඳහා අළුතෙන් එකතුවන වැඩිහිටියන්ගේ බාරකරුවන් හෝ අදාල වසමේ ග්‍රාම නිලධාරී දැනුවත් කිරීම | 30 |
| 09 | ආපදා වාරික ගෙවීම් සඳහා ගෙවීම් කළ යුතු අයගේ චෙක්පත් ලබා ගත හැකි බව දැනුම් දීම | 50(ආපදා නිවාස ව්‍යාපෘති අවසන් වනතෙක් පමණි) |
| 10 | වාහන ආදායම් බලපත්‍ර කල් ඉකුත්වීමට දින 03 කට පෙර පෙර වසරේ මෙම කාර්යාලයෙන් ආදායම් බලපත්‍ර ලබා ගත් අය දැනුවත් කිරීම | 500 |
| 11 | සංවර්ධන කටයුතු වෙනුවෙන් ගෙවීම් කිරීමට ඇති ගෙවීම් වලට අදාල චෙක්පත් ලබා ගත හැකි බව දැනුම් දීම | 50 |
| 12 | විශ්‍රාම වැටුප් ජීවිත සහතික නියමිත දිනට බාර දීමට කටයුතු කරන ලෙස හා බාර දී නොමැති අය නියමිත දිනට බාරදෙන ලෙස දැනුවත් කිරීම | 1500 (වාර්ෂිකව) |
| 13 | කැපකරු නිවුන් දරු ආදීආධාර මුදල් ලබා ගත හැකිබව ප්‍රතිලාභීන් දැනුවත් කිරීම | 30 |
| 14 | ගර්භණී මාතාවන් සඳහා ලබා දෙන අයදුම් කර ඇත් පෝෂණ ආධාර වවුචර්පත් ලබා ගත හැකි බව දැනුම් දීම | 200 |
| 15 | පෙර පාසල් උදෑසන ආහාර වේල් සඳහා ගෙවීම් කිරීමට අදාල චෙක්පත් ලබා ගත හැකි බව දැනුම් දීම | 30 |
| 16 | පෙර පාසල් ගුරු දීමනා බැංකු ගත කර ඇති බව පෙර පාසල් ගුරුවරු දැනුවත් කිරීම | 100 (අවස්ථානුකූලව) |
| 17 | පෝෂණ මල්ලනිකුත් කරන ආයතනවලය අදාල චෙක්පත් ලබා ගන්නා ලෙස දැනුම් දීම | 06 |
| 18 | සෙවීම්කර,සෙවීම් කිරීමට බාර දී ඇති උපත්,මරණ, විවාහ සහතික ලබා ගැනීමට පැමිණෙන ලෙස දැනුම් දීම | 100 |
| 19 | ආදායම් සහතික/ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම් අනුමත වී ඇති බව හා අදාල මුදල් ගෙවීම් කරන ලෙස දැනුම් දීම | 30 |
| 20 | ආදායම් සහතික/ව්‍යාපාර ලියාපදංචි කිරීමේ සහතික ලබා ගත හැකි බව දැනුම් දීම | 30 |
| 21 | ඉඩම් සඳහා දීමනා පත්‍ර හා බලපත්‍ර පසු අයිතිය සඳහන් කිරීම ඉටු කර ඇති බව දැනුම් දීම | 30 |
| 22 | ඉඩම් සඳහා දීමනා පත්‍ර හා බලපත්‍ර මුල් අයිතිය ලබා දීම ඉටු කර ඇති බව දැනුම් දීම | 30 |
| 23 | දීමනා පත්‍ර හා බලපත්‍ර මැනුම් කිරීම හා උකස් කිරීම අනුමත කර ඇති බව දැනුම් දීම | 30 |
| 34 | දැව හෙලීම් අයදුම්පත්‍ර අනුමත කර ඇති බව දැනුම් දීම | 100 |
| 35 | දැව ප්‍රවාහන අයදුම්පත්‍ර අනුමත කර ඇති බව දැනුම් දීම | 100 |
| 36 | අනවසර ඉඩම් කච්චේරි සඳහා කැඳවීම් කිරීම | 100 |

| | | |
|---|---|---|
| 37 | රජයේ දීර්ඝ කාලීන /වාර්ෂික බදු ගෙවීම් කළ යුතු බව සිහි කැඳවීම | 100 |
| 38 | වැලි තොටුපළ සඳහා වාර්ෂික නිර්දේශය ලැබී ඇත් බව | 10 |
| 39 | ගෘහස්ථ පස්/වැලි කැණීම් අයදුම්පත්‍ර අනුමත කර ඇති බව | 20 |
| 40 | අත්පත් වන්දි මුදල් සඳහා චෙක්පත් ලබා ගත හැකි බව | 20 |
| 41 | නොතාරිස් ඔප්පු මගින් රජයේ ඉඩම් පැවරීම් ඉල්ලීම් /කෙටුම්පත් අනුමත කර ඇත් බව දැනුම් දීම | 20 |
| 42 | වෙනත් (අවශ්‍යතාව අනුව හඳුනාගනු ලබන ) | 100 |

07. ව්‍යාපෘති සාධාරණීකරනය -

ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ප්‍රදේශයේ මහජනතාවට සැපයෙන සේවාවන් බොහොමයක් තවමත් සිදුවන්නේ සාම්ප්‍රදායික ක්‍රමවේද අනුගමනය කිරීමෙනි.ඇතැම් සේවාවන් සඳහා පරිගණක තාක්ෂණය භාවිතා කළද එයද ඉතා සීමිත සේවාවන් කිහිපයක් සඳහා පමණි.පෞද්ගලික අංශයේ ආයතන අති නවීන තාක්ෂණික මෙවලම් භාවිතා කරමින් වර්තමානය වන විට ඉතා කාර්යක්ෂම අයුරින් තම සේවාවන් මහජනයා වෙත සපයන පසුබිමක රජයේ ආයතන තුළ සේවා සැපයීමේ ප්‍රමාදයන්ට හේතු වී ඇත්තේ වැඩ පහසු කිරීමේ ක්‍රම අනුගමනය කිරීම ඉතා අඩු මට්ටමක පැවතීම හේතුවෙනි.ඇතැම් විට එක් කාර්යයක් සඳහා එක් පුද්ගලයෙකුට කිහිප වරක් කාර්යාලයට පැමිණීමට සිදුවන අවස්ථාද නැතුවා නොවේ.රාජ්‍ය අංශය පෞද්ගලික අංශය හා කරට කර ගැටීමට නම් අතිශයින් කාර්ය බහුල සමාජ ආර්ථික වටපිටාවක ජීවත්වන මහජනයාට ඍජු හා කඩිනම් සේවාවක් සැපයීමේ අවශ්‍යතාවය දැඩිව පවතී.

මෙම ව්‍යාපෘතිය කාර්යාලය තුළ ක්‍රියාත්මක කිරීම තුළින් මහජනතාවගේ වටිනා කාලය,ශ්‍රමය,හා මුදල් ඉතිරි වීම හා නිලධාරීන්ටද තම රාජකාරි වඩා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා යම් පෙළඹවීමක් ලැබෙනු ඇත.ඒ තුළින් මහජන පැමිණිලි අවම වනවා සේම පොදු මහජනයා අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සැපයෙන සේවාවන් පිළිබඳ යම් විශ්වසනීයත්වයක් ගොඩ නැගෙනු ඇත.

එසේම , වසරේ වැඩි කාලයක් වර්ෂාපතනය ලැබෙන බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පසුගිය කාලයේ දැඩි ලෙස ගං වතුර හා නාය යාම් තර්ජනයන්ට ගොදුරු වූ ප්‍රදේශයකි.එහිදී ජීවිත හානි හා දේපළ හානි විශාල ලෙසින් වාර්තා වූ අතර විශාල වශයෙන් වන්දි මුදල් ගෙවීමටද සිදු විය.එවැනි වාතාවරණයක් යටතේ ඉදිරියේදී ඇතිවිය හැකි අවදානම් තත්වයන් පිළිබඳ පූර්ව සූදානමක අවශ්‍යතාවය බෙහෙවින් පවතී.

එවැනි සූදානමක් සඳහා එම හදිසි තත්වයන් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම සඳහා විධිමත් සන්නිවේදන ක්‍රමයක් පවත්වා ගෙන යාම අතිශයින් වැදගත් වේ.එකවර වැඩි සංඛ්‍යාවකට පණිවිඩය සන්නිවේදනය වන නිසා සාමූහිකව ක්‍රියාත්මක වී අනතුරෙන් බේරී ආරක්ෂිත ස්ථාන කරා යාමට ජනතාවට අවකාශ සැළසෙන අතර නිලධාරීන්ටද කල් වේලා ඇතිව ක්‍රියාත්මක වී අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට ඉඩ කඩ සැළසෙනවා ඇත.

එයට අමතරව,මාසිකව පවත්වනු ලබන රැස්වීම් සඳහා අත්‍යාවශ්‍ය වන බාහිර ආයතනවල නිලධාරීන් සම්බන්ධ කර ගැනීමට මාස්පතා ලිපි යොමු කිරීමට සිදුවීම හේතුවෙන් තැපැල් වියදම් ලෙස සැළකිය යුතු වියදමක් දැරීමට සිදුවන අතර ඇතැම් අවස්ථාවල එම ලිපි කලට වේලාවට නොලැබී යාම නිසා රැස්වීම්වලට නිසි වේලාවට සහභාගි වීමට නොහැකිවීම හේතුවෙන් රැස්වීමේදී සාකච්ඡා කරන ලද කරුණු එම නිලධාරීන්ට නිසි පරිදි සන්නිවේදනය නොවේ.එවැනි අවස්ථාවලදී තීරණ ගැනීමේ ගැටළු ඇතිවනවා මෙන්ම ප්‍රාදේශීය සංවර්ධන කටයුතු වෙනුවෙන් ගන්නා වැදගත් තීන්දු තීරණ අදාල නිලධාරීන් වෙත දැනුම් දීම සඳහා නැවතත් ලිපි යොමු කිරීමට හෝ දුරකථන පණිවිඩයක් ලබා දීමට සිදුවේ.මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම තුළින් අදාල පුද්ගලයාටම පණිවිඩය කල්වේලා ඇතිව සන්නිවේදනය වන අතර ඉහත ගැටළු අවම කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

08. අනුමැතිය

දිස්ත්‍රික් ලේකම් (කළුතර)

ඉහත ව්‍යාපෘති යෝජනාව අනුව බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවා සැපයීම වඩා විධිමත් කිරීම සඳහා කෙටි පණිවිඩ ජාලයක් ස්ථාපනය කිරීම සඳහා අනුමැතිය පතමි.

පී.ආර්.ප්‍රසාද් පෙරේරා
ප්‍රාදේශීය ලේකම්
බුලත්සිංහල.

ඉහත කරුණු සලකා බලා මෙම ව්‍යාපෘති යෝජනාව ක්‍රියාත්මක කිරීම අනුමත කරමි. / පහත යෝජනාවලට යටත්ව ක්‍රියාත්මක කිරීම අනුමත කරමි. / අනුමත නොකරමි.

දිස්ත්‍රික් ලේකම් ,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.
කළුතර.